එහි සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහිලා
<u>කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත්බද මහාධිකරණයේදී ය.</u>

2007 අංක.7 දරණ සමාගම් පනතෙහි X කොටස යටතේ සහ එහි නියමයන් ප්‍රකාර කරනු ලබන ඉල්ලීමක් පිළිබඳව වන කාරණයක් සම්බන්ධයෙනි.

කන්සල්ටන්ට්ස් 21 ලිමිටඩ්
167/4, විපුලසේන මාවත,
කොළඹ 10.

පෙත්සම්කරු.

නඩු අංකය :H.C.Civil 52/2011/CO

එදිරිව

1. හොටෙල් ඩෙවලපර්ස් (ලංකා) ලිමිටඩ්
එච්ලන් චතුරශ්‍රය,
කොළඹ 01.

2. මහාභාණ්ඩාගාරයේ ලේකම්
මහාලේකම් කාර්යාලය,
කොළඹ 01.

3. නිහාල් ශ්‍රී අමරසේකර
167/4, විපුලසේන මාවත,
කොළඹ 10.

4. මිට්සුයි ඇන්ඩ් කම්පනි ලිමිටඩ්
2-1 ඔහෙටමාචි 1 - චෝමේ,
චියෝඩා - කු, ටෝකියෝ,
ජපානය.
සහ කොළඹ 01, එච්ලන් චතුරශ්‍රයේ, ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ, නැගෙනහිර කුළුණෙහි ද.

5. තායිසේ කෝපරේෂන්
25-1 නිශි-සින්ජුකු, ටෝකියෝ,
ජපානය.
සහ
අංක.122, ඇග්‍රෝ මෙරයින් ගෲප්
ගොඩනැගිල්ල, කිව් පාර, කොළඹ 02.

6. කෝර්නල් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්
අංක.188, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

වගඋත්තරකරුවන්.

මේ සමඟ පෙත්සම්කරුගේ පෙරකලාසිය, පෙත්සම සහ එහි ඉංග්‍රීසි පරිවර්තනය, A1, A2, A3(a), A3(b), A3(c), A3(d), A3(e), A4(a), A4(b), A5, A6(a), A6(b), A7, A8(a), A8(b), A9, A10(a), A10(b), A10(c), A11 සහ A12 වශයෙන් ලකුණු කරන ලද ලේඛන ඉදිරිපත් කරන අතර ඒවා භාරගෙන පෙත්සමේ ආයාචනයේ අයැද ඇති සහනයන් ලබාගැනීම සඳහා කරුණු තහවුරු කිරීම පිණිස මෙම නඩුව වර්ෂ 2011 ක්වූ නොවැම්බර් මස 14 වන දින විවෘත අධිකරණයේ කැඳවන මෙන් ගෞරවයෙන් අයැද සිටිමු.

වර්ෂ 2011 ක්වූ නොවැම්බර් මස 08 වන දිනදී ය.

V. W. Kularatne Associates
පෙත්සම්කරුගේ නීතිඥවරුන්.

V. W. KULARATNE ASSOCIATES
Attorneys-at-Law & Notaries Public
18/39, Mudandiram Dabare Mawatha
Colombo 5, Sri Lanka.

එහි සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහිලා
කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත්බද මහාධිකරණයේදී ය.

2007 අංක.7 දරණ සමාගම් පනතෙහි X කොටස යටතේ සහ එහි නියමයන් ප්‍රකාර කරනු ලබන ඉල්ලීමක් පිළිබඳව වන කාරණයක් සම්බන්ධයෙනි.

කන්සල්ටන්ට්ස් 21 ලිමිටඩ්
167/4, විපුලසේන මාවත,
කොළඹ 10.

පෙත්සම්කරු.

නඩු අංකය :H.C.Civil 52/2011/CO

එදිරිව

1. හොටේල් ඩෙවලපර්ස් (ලංකා) ලිමිටඩ්
එච්ලන් චතුරශ්‍රය,
කොළඹ 01.

2. මහාභාණ්ඩාගාරයේ ලේකම්
මහාලේකම් කාර්යාලය,
කොළඹ 01.

3. නිහාල් ශ්‍රී අමරසේකර
167/4, විපුලසේන මාවත,
කොළඹ 10.

4. මිට්සුයි ඇන්ඩ් කම්පනි ලිමිටඩ්
2-1 ඔහෙටමාචි 1 - චෝමේ,
චියෝඩා - කු, ටෝකියෝ,
ජපානය.
සහ කොළඹ 01, එච්ලන් චතුරශ්‍රයේ, ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ, නැගෙනහිර කුළුනෙහි ද.

5. තායිසේ කෝපරේෂන්
25-1 නිශි-සින්ජුකු, ටෝකුයෝ,
ජපානය.
සහ
අංක.122, ඇග්‍රෝ මෙරයින් ගෲප්
ගොඩනැගිල්ල, කිව් පාර, කොළඹ 02.

6. කෝර්නල් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්
අංක.188, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

වගඋත්තරකරුවන්.

වර්ෂ 2011 ක්වූ නොවැම්බර් මස 08 වන දිනදී ය.

ස්වකීය නීතිඥවරුවන් වන වී.ඩබ්ලිව්.කුලරත්න ඇසෝෂියේට්ස් යන නාමය, විලාසය සහ අභිධානය යටතේ නීතිඥ වෘත්තියෙහි යෙද සිටින නීතිඥ යමුනා බාලසූරිය සහ නීතිඥ විජයලක්ෂ්මි දීපානි නිරෝෂිනි විජේසේකර මගින් පෙනී සිටින ඉහත නම් සඳහන් ***පෙත්සම්කරු සිය පෙත්සමෙන්*** මෙසේ ප්‍රකාශ කර සිටි.

1. පෙත්සම්කරු (මෙහි මතු සමහරතැන් හි "HDL" යනුවෙන් සඳහන් කරනු ලබන) හොටේල් ඩෙවලපර්ස් (ලංකා) ලිමිටඩ් යන සමාගමේ කොටස් හිමියකු වන අතර, 2007 අංක.7 දරණ සමාගම් පනතේ 256 (i) (c) වගන්තියේ නියමයන් ප්‍රකාර ගෞරවනීය ඔබතුමාණන්ගේ අධිකරණයේ අවසරය පතා සිටීමට සහ එම පනතේ X කොටස යටතේ සහ එහි නියමයන් අනුව මෙම ඉල්ලීම කර ඉදිරියට ගෙන යාමට පෙත්සම්කරුට හිමිකම් ඇත.

*HDL සමාගමේ පෙත්සම්කරුගේ කොටස් හිමිකම් දැරීම ස්ථිර කිරීමේ සත්‍ය පිටපතක් "A1" යනුවෙන් ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙසට අයැද යා කොට ඇත.*

2. (a) 1 වන වගඋත්තරකරු, එවකට 1982 අංක.17 දරණ සමාගම් පනත යටතේ 1983.03.15 දින සංස්ථාගතවුන, එහි ලියාපදිංචි කාර්යාලය මෙම ගරු අධිකරණයේ අධිකරණ බල ප්‍රදේශය ඇතුළත, ඉහත සඳහන් ස්ථානයේ ඇත්තාවූ, සීමිත බැඳීම් සහිත වන පොදු සමාගමක් වන අතර, කොළඹ හිල්ටන් හෝටලයේ අයිතිකාර සමාගම සහ 2007 අංක.7 දරණ සමාගම් පනත යටතේ පවත්නා සමාගමකි.

(b) 2 වන වගඋත්තරකාර HDL සමාගමේ කොටස් හිමියකු වන මහාභාණ්ඩාකරයේ ලේකම්වරයා වන අතර, 4 සහ 5 වන වන වගඋත්තරකරුවන්ට HDL සමාගම වෙනුවෙන් ඇපකර නිකුත් කර, ඒවා යටතේ මුදල් ද ගෙවා ඇත.

(c) (i) 3 වන වගඋත්තරකරු, HDL සමාගමේ අනුග්‍රහයකදායකයකු, පළමු අධ්‍යක්ෂකවරයෙකු සහ වරක් සභාපතිවරයකු ද වේ.

(ii) HDL සමාගමේ අයිතියෙන් සහ එහි ප්‍රයෝජනය තකා ඔහු 1990.09.13/1991.01.11 දිනයන් හී පිළිවෙළින් කොළඹ දිස්ත්‍රික් උසාවි අංක.3155/විශේෂ සහ අංක.3231/විශේෂ දරණ ව්‍යුත්පන්න නඩු පවරා සිටින ලදි.

(iii) HDL සමාගමෙන් සහ ඇපකරු වශයෙන් ශ්‍රී ලංකා රජයෙන් ඔවුන් විසින් දක්වා සිටි හිමිකම්පෑම් වලින් (එවකට ශ්‍රී ලංකා මුදලින් රුපියල් මිලියන 10,200/- කට සමාන වූ) ජපන් යෙන් මිලියන 17,586 ක් කපා හැරීමක් ඔහු විසින් 1995.06.28 වන දින 4 වන සහ 5 වන වගඋත්තරකරුවන්ගෙන් ලබා ගන්නා ලදි.

(iv) HDL සමාගමටත්, ඇපකරු වශයෙන් ශ්‍රී ලංකා රජයටත් අතිශයින්ම ප්‍රතිලාභදායිවූන, HDL සමාගම තවදුරටත් මූල්‍යම වශයෙන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා එක් වසරක සහනදායි කාල සීමාවක් ද සහිතව, (මුලින් 1999 වන විට සම්පූර්ණයෙන්ම ගෙවිය යුතුව තිබුණ ඉතිරි ණය මුදල) 2010 තෙක් වැඩිදුර 15 වසරක කාලසීමාවකට (මුලින් 6% බැගින්වූන පොළිය) අඩුකළ වසරකට 5.25% බැගින් පොළියක් මත ගෙවීමට ප්‍රතිලේඛණගත කිරීමට 4 වන සහ 5 වන වගඋත්තරකරුවන් එකඟ වන ලදි.

*එම කපා හැරීම සහ ප්‍රතිලේඛණගත කිරීම පිළිබඳව සවිස්තර ලෙස කරුණු දැක්වෙන 1995.06.28 දින දරණ අධ්‍යක්ෂ මණ්ඩල ලේඛණයේ සත්‍ය පිටපතක් "A2" යනුවෙන් ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙසට අයැද යා කොට ඇත.*

(v) වසරකට 12% බැගින් වන සාමාන්‍ය පොළියක් මත 1995 ජූනි මස රුපියල් මිලියන 10,200 ක් කපා හැරීම අද දින රුපියල් <u>මිලියන 70,033</u> ක සුවිශාල ප්‍රමාණයකට ගණනය වන අතර, එමගින් 3 වන වගඋත්තරකරු සෑහෙන ප්‍රමාණයක පරදු දරන්නකු (stake holder) විය.

(d) 4 වන සහ 5 වන වගඋත්තරකරුවන් එක් අයකුට අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු නම්කර පත් කිරීමට අයිතිවාසිකම් ඇති, HDL සමාගමේ මූලික කොටස් හිමියන් වන අතර, HDL සමාගමේ හිල්ටන් හෝටලය ඉදිකර සහ සංවර්ධනය කිරීමට වගකීමක් දරණ ලද්දෝ විය.

(e) 6 වන වගඋත්තරකරු HDL සමාගමේ කොටස් හිමියකු වන අතර, අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු නම්කර පත් කිරීමට අයිතියක් සහිත වුන එහි ප්‍රධාන ප්‍රවර්ධකයකු විය.

(f) **HDL සමාගමට මුදල් අමාත්‍යාවරයා විසින් 1990.12.21 දින සිට එහි සාමාජිකයින් 11 දෙනෙකුගෙන් යුත් අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් 6 දෙනෙකු නම්කර පත් කිරීමට අයිතියක් තිබුන සහ අයිතියක් සතුව ඇති අතර, එමඟින් HDL සමාගමේ කළමනාකරණය සහ පාලනය මුදල් අමාත්‍යවරයා විසින් මෙහෙය වන ලදි.**

3. 3 වන වගඋත්තරකරුගේ ඉහත සඳහන් ව්‍යුත්පන්න නඩු 2 සමථයක් කිරීමට ශ්‍රී ලංකා රජය විසින් කරන ලද නියමයන් කරණ කොටගෙන එවකට නීතිපතිතුමා විසින් සමථ ගිවිසුම් 5 ක් සමාප්ත කරන ලද අතර, ඒවා 1995.06.28 වන දින ලියා අත්සන් කරන ලදී.

***එම සමථ ගිවිසුම් පහේ හි සත්‍ය පිටපත් පිළිවෙලින් "A3(a)", "A3(b)", "A3(c)", "A3(d)" සහ "A3(e)" යනුවෙන් ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙසට අයැද යා කොට ඇත.***

4. (a) ඉතිරි ණය මුදල් සේවා කිරීමට එහි මූල්‍ය ප්‍රායෝගිකත්වය වැඩිකිරීමට, මූල්‍යමය වශයෙන් **<u>HDL සමාගම වැඩිදුර ප්‍රතිව්‍යුහගත කිරීමේ</u>** අභිලාෂයෙන් යුතුව, 1995 ජුනි මසැති සමථ ගිවිසුම්වල පහත දැක්වෙන කොන්දේසි අඩංගු විය.

*"14. හෝටලයේ හෝටල් කාමර සහිත 3 වන කුළුනු කොටස ඉදිකිරීමේ ශක්‍යතාවය ගවේෂණය කිරීම සහ ඉහත කී පරිදි මිට්සුයි සහ තායිසේ වෙත සහ/හෝ රජයට වන ඉහත කී එම ණය මුදල්, ආපසු ගෙවීමට හැකිවන සේ, HDL සමාගමේ ලාභදායිකත්වය සහ ණයසේවා කිරීමේ හැකියාව වැඩි කරලීමට ප්‍රායෝගික වේයයි සැලකෙන ලෙසට හිමිකම් නිකුතුවක් සහ/හෝ එහි කොටස්වල නව නිකුතුවක් මඟින්, එම ඉදිකිරීමේ පිරිවැයට මුදල් යෙදීම HDL සමාගම විසින් කළයුතුය සහ කරනු ලබන්නේ ය."*

*"15. මෙම ගිවිසුමේ සහ අංක.1 දරණ ගිවිසුමේ අරමුණු උදෙසා අවශ්‍යවන්නාවූ එහි ලාභදායිකත්වය සහ මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රක්ෂේපණයන් HDL සමාගම විසින් හෝටලයේ කළමණාකරුවන් වන හිල්ටන් ඉන්ටර්නැෂනල් සහ/හෝ HDL සමාගමේ විගණකවරුන් මඟින් විධිමත්ව සකස් කර ගැනීම HDL සමාගම විසින් සිදුකළයුතු ද සහ සිදුකරනු ලබන්නේ ය."*

(b) (i) කෙසේ නමුදු, HDL සමාගමේ වැඩිදුර මූල්‍ය ව්‍යුහගත කිරීම, එමඟින් වළක්වාලමින් සහ/හෝ ව්‍යාර්ථ කරමින් එවකට අධිකරණ අමාත්‍ය සහ නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමා 1995 වසරේ දී මැදිහත්වී, සමථ ගිවිසුම් සාවද්‍ය සහ නීති විරෝධී ලෙස අත්හිටුවන ලදී.

(ii) එමහේතු තත්වයන් මත, ඔහු විසින් HDL සමාගමට සිදුකළ අලාභ ඉල්ලුම් කරමින් 3 වන වගඋත්තරකරු විසින් එවකට අධිකරණ අමාත්‍ය සහ නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයාට විරුද්ධව කොළඹ දිස්ත්‍රික් උසාවි අංක.21819/එම්.ආර්. දරණ නඩුව පවරන ලද අතර එම නඩු තවමත් පවතී.

*1995.07.24 දිනැති ලිපිවල සත්‍ය පිටපත් "A4(a)" සහ "A4(b)" යනුවෙන් ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙසට අයැද යා කොට ඇත.*

5. (a) ඉන් අනතුරුව, එවකට අධිකරණ අමාත්‍ය සහ නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයාට අහිතකර ලෙස බලපෑ කොන්දේසිය පමණක් ඉවත්කොට, 1995 ජුනි මස සමථය ගිවිසුම්වලට නීතිපතිතුමා විසින් සමාප්ත කරනු ලැබූ 1996 ඔක්තෝබර් මස දී අත්සන් කළ පරිශිෂ්ඨයක් මඟින් සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරිමට ශ්‍රී ලංකා රජයට අවශ්‍ය වී එසේ සිදුකරන ලදී.

*1996 ඔක්තෝබර් මස පරිශිෂ්ඨය එයට ඇමුණුම් ද සහිතව "A5" යනුවෙන් ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙසට අයැද යා කොට ඇත.*

(b) පූර්වෝක්ත අත්හිටුවීම, HDL සමාගම වස්තු භංගත්වයේ උග්‍ර මූල්‍ය ප්‍රපාතයට ඇද හෙළා දැමුන අතර, ආනුෂංගිකව 4 වන සහ 5 වන වගඋත්තරකරුවන්ට ඉතිරි ගෙවීම් කිරිම සඳහා සැළකිය යුතු මුදල් ප්‍රමාණයක් HDL සමාගමට අත්තිකාරම් කිරිමට ශ්‍රී ලංකා රජයට සිදුවිය.

6. (a) හිල්ටන් හෝටලය ඉදිකරනු ලැබුවාවූ ආසන්න වශයෙන් අක්කර 7 ක ප්‍රමාණයකින් වන නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩමට 6 වන වගඋත්තරකරු 99 වසරක අතුරු බදුදීම සඳහා ප්‍රතිෂ්ඨාව වශයෙන් රුපියල් මිලියන 250.9 ක අගයකින් යුතු HDL සමාගමේ කොටස් 25,089,750 ක් විභාජනයකොට ඇත.

(b) 1999 ජූලි මස දී අංක.673 සහ 674 දරණ විශේෂ ප්‍රදාන පාවරණය කිරීමේ සාධන පත්‍ර ප්‍රකාර, රාජ්‍ය ඉඩම් ආඥාපනතේ නියමයන් අනුව, එම ඉඩම්වල අයිතිකාරත්වය නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් ආපසු ශ්‍රී ලංකා රජයට පාවරණය කර ඇත. **(A7 හී P2(a) / P2(b) බලන්න)**

(c) ආනුෂංගිකව, HDL සමාගම රාජ්‍ය ඉඩම්වල අනෛතික අනවසර පදිංචිකරුවකුගේ තත්වයට පත් කරමින් 2011 මාර්තු මසදී එම ඉඩම්වල භෞතික සන්තකය සතුකරගත් බව ශ්‍රී ලංකා රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

(d) එමගින්, HDL සමාගමේ කොටස් 25,388,463 වෙන්කර විභාජනය කිරිම සඳහාවුන ප්‍රතිෂ්ඨාව නිෂ්ඵලදායිතාවයට පත්වුන අතර, එම කොටස් ගෙවා නොමැති කොටස් තත්වයකට පත්වුනි.

(e) ඒ අනුව, HDL සමාගමේ සම්පූර්ණයෙන් ගෙවා නිමකළ කොටස් පහත දැක්වෙන තත්වයට පත්විය.

| | | කොටස් ගණන | රු.මිලියන |
|---|---|---|---|
| 99 වසරක ඉඩම් බද්ද සඳහා විභාජනය කළ HDL කොටස්. | - | 25,089,750 | නැත |
| ගෙවීමක් සඳහා 6 වන වගඋත්තරකරුට විභාජනය කළ HDL කොටස් සහ මහාභාණ්ඩාගාරයේ ලේකම් වෙත පැවරූ - කොටස් | | 298,713 | 3 |
| ඒවා සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගෙවීමක් කරන ලද HDL කොටස් | - | 4,000,000 | 40 |
| 4 සහ 5 වගඋත්තරකරුවන් + ඔවුන්ගේ ණාමිකයන් විසින් දරණ HDL කොටස් | - | 12,445,325 | 124 |
| මහජනයා විසින් දරණ HDL කොටස් | - | 3,392,353 | 34 |
| එකතුව | - | 45,226,141 | 201 |

7. **"A3(a)", "A3(b)", "A3(c)" සහ "A3(d)" සමඨය ගිවිසුම් ප්‍රකාරව, ඉඩම ශ්‍රී ලංකා රජය විසින් කෙළින්ම HDL සමාගමට බදු දීමට බැඳී ඇත.**

8. (a) 2004/2005 වසර අතරවාරයේ 3 වන වගඋත්තරකරු HDL සමාගමේ සභාපතිවරයා වශයෙන් නිරතව සිටියදී, **(A7 හි P11 බලන්න)** කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රමන්ත්‍රණය කමිටුවක් විසින් විධිමත්ව සකස් කළ යෝජනාවක් ප්‍රකාර මුල්‍යමය වශයෙන් HDL සමාගම ප්‍රතිව්‍යුහයගත කිරීමට උත්සහයක් දැරුවේ ය.

(b) ඊට අනුකූලව, එවකට මුදල් අමාත්‍ය සරත් අමුණුගම විසින් 2005.10.05 දිනැති කැබිනට් සංදේශයක් ඉදිරිපත් කළ අතර, එය 2005.10.13 දින අනුමත කරන ලදි.

*එම කැබිනට් සංදේශයේ සහ අනුමැතියේ සත්‍ය පිටපත් පිළිවෙළින් "A6(a)" සහ "A6(b)" යනුවෙන් ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙසට අයැද යා කොට ඇත.*

9. පූර්වෝක්ත ප්‍රතිව්‍යුහයගත කිරීම මුදුන්පත් නොවීමෙන් HDL සමාගම,

(a) 2005.06.30 දින වන විට රුපියල් මිලියන 201 ගෙවා නිම කළ එහි කොටස් ප්‍රාග්ධනය සම්පූර්ණයෙන්ම සෝදාපාළුවී දියවී යෑම සහිතව නිරපේක්ෂිත අන්දමට වස්තු බංගත්වයට පත්වීමේ,

(b) දක්නට තිබුන වැඩිදුර පිරිහීම සහිතව, 2005.06.30 වනවිට රුපියල් මිලියන 6,351.5 ක එකතුවුන පාඩුවලට මුහුණපෑමේ,

(c) 2006.06.30 දිනට ශ්‍රී ලංකා රජයට මුල් මුදල (රු.2,991,482,954/-) සහ පොළී (රු.2,575,397,443/-) ද යන දෙකම එකතුව රු.5,566,880,397/- ක අතිවිශාල ණය මුදල් කන්දරාවක් ගෙවීම පැහැර හැරීමේ සහ 4 වන සහ 5 වන වගඋත්තරකරුවන්ට රාජ්‍ය ඇපකර යටතේ 2005.06.30 දිනට වසරකට 5.25% බැගින් පොළී සහිතව රු.2,386,551,716 ක වැඩිදුර ණය මුදල් ගෙවීමට තිබීමේ,

සම්බන්ධතාවය මත HDL සමාගම ඈවර කිරීම සඳහා 3 වන වගඋත්තරකරු විසින් කොළඹ දිස්ත්‍රික් උසාවි අංක.217/සී.ඕ. දරණ නඩුවේ 2006.11.17 දින දරණ පෙත්සම, 1982 අංක.17 දරණ සමාගම් පනතේ ප්‍රතිපාදනයන් යටතේ ඉදිරිපත් කරන ලදි.

***2006.11.17 දිනැති ඈවර කිරීමේ පෙත්සම, එයට P1 සිට P14 දක්වා ලකුණු කළ ලේඛණ සහිතව, සංක්ෂිප්ත ලෙස "A7" යනුවෙන් ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙසට අයැද යා කොට ඇත.***

10. HDL සමාගමේ 2005.06.30 දිනට ශේෂ පත්‍රයේ කෙටුම්පත මෙසේ ය.

| | | රුපියල් මිලියන |
|---|---|---|
| ස්ථාවර වත්කම් | - | 2,139 |
| ජංගම වත්කම් | - | 744 |
| ජංගම වගකීම් | - | 271 |
| | | 473 |
| ශුද්ධ වත්කම් | - | 2,612 |
| කොටස් ප්‍රාග්ධනය - ගෙවා නිමකළ | - | 201 |
| - ගෙවා නොමැති ව්‍යාර්ථ වී ඇති ඉඩම් බද්ද සඳහා විභාජනය කළ | - | 251 |
| සංචිත | - | 861 |
| (එකතුවුන පාඩුව) | - | (6,351) |
| | | (5,038) |
| දිගුකාලීන බැඳීම් | - | 7,650 |
| අරමුදල් ප්‍රවාහයන් | - | 2,612 |

11. (a) පූර්වෝක්ත අවදානම් තත්වය එතකදුවුවත්, HDL සමාගම ඈවර කරනවාට විරෝධපාමින් 2007.01.26 වන දින අනුමත කරන ලද HDL සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම විකල්පයක් වශයෙන් අධිකරණයට දැනුම් දෙන ලෙසට මහාභාණ්ඩාගාරයේ ලේකම්ගේ උපදෙස් මත, මුදල් අමාත්‍යවරයා විසින් 2007.01.21 දින දරණ කැබිනට් සංදේශයක් ඉදිරිපත් කර ඇත.

*එම කැබිනට් සංදේශයේ සහ ඒ සඳහා අනුමැතියේ සත්‍ය පිටපත් පිළිවෙලින් "A8(a)" සහ "A8(b)" යනුවෙන් ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙසට අයැද යා කොට ඇත.*

(b) මෙම හේතු තත්වයෙහිලා, සමථයකට එළඹීමේ හැකියාවක් ගවේෂණය කර බැලීම සඳහා නීතිපතිතුමා විසින් 2010.09.16 දිනැති ලිපිය මඟින් රැස්වීමක් කැඳවා සිටින ලදී. එසේ නමුදු එවැනි සාකච්ඡාවක් කෙදිනකවත් පැවතියේ නැත.

*2010.09.16 දින ලිපියේ සත්‍ය පිටපතක් "A9" යනුවෙන් ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙසට අයැද යා කොට ඇත.*

12. (a) ගෙනහැර දක්වා ඇති HDL සමාගමේ තත්වයන් අනුව, 2007 අංක.7 දරණ සමාගම් පනතේ 219 වගන්තිය HDL සමාගම ඈවර කිරීම විධානාත්මක කරන අතර, HDL සමාගම ඈවර කිරීමට විරුද්ධවීමේහිලා, HDL සමාගමේ ණය සඳහා එහි අධ්‍යක්ෂවරුන්, රජයේ අය හෝ අන්අය හෝ වේවා, පුද්ගලිකවම වගකීමකට බැඳේ.

(b) මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ විසින් පත්කරන ලද HDL සමාගමේ සභාපති නඩාස් රජාබ්දීන්, 2007.01.26 දින කැබිනට් තීරණයකටත් පෙරාතුව පවා 2006.12.08 දිනැති දිවුරුම් ප්‍රකාශය මඟින් HDL සමාගම ඈවර කරනවාට විරුද්ධ විය.

(c) ඊට අමරතව, 2007 අංක.7 දරණ සමාගම් පනතේ 375 වගන්තිය රජයේ හෝ වේවා අන් අය හෝ වේවා අධ්‍යක්ෂකරුවන් පුද්ගලිකවම සමාගමක ණය සඳහා වගකිවයුතු බවට පත් කරමින්, සමාගමක් විසින් වංචනික වෙළදාමේ යෙදීම තහනම් කොට ඇත.

(d) සමාගමක කොටස් ප්‍රාග්ධනයේ 5% ක්ම සොදා පාළු වී ප්‍රාග්ධනයේ බරපතල පාඩුවක් සිදුවී ඇති තත්වයන්හිලා, වෙනත් දේ අතර, පාඩුවල ප්‍රමාණය, ඒ සඳහා හේතූන් සහ පාඩු නැවත පියවීම පිළිබඳව කරුණු දැක්වීමට අතිවිශේෂ මහ සභා රැස්වීමක් කැඳවීමට 2007 අංක.7 දරණ සමාගම් පනතේ 220 වගන්තියේ නියමයන් අනුව අධ්‍යක්ෂකවරුන් යුක්ති ගරුකව බැඳී ඇත.

(e) HDL සමාගමේ තත්වය අනුව, එහි මුළු කොටස් ප්‍රාග්ධනය යම් සෝදා පාළුවී ඇති අතර එතකදු වුවත්, 2007 අංක.7 දරණ සමාගම් පනතේ විධානාත්මක 220 වගන්තිය ඉටු කිරීමට අධ්‍යක්ෂකවරුන් අසමත් වී ඇත.

**(f) අධ්‍යක්ෂකවරයෙකු එම පනතේ මොනයම් හෝ විධිවිධානයන් උල්ලංඝනය කරමින් ක්‍රියා කිරීම හෝ ක්‍රියා කිරීමට එකඟවීම, 2007 අංක.7 දරණ සමාගම් පනතේ 188 වගන්තිය තහනම් කොට ඇත.**

(g) එමනිසා HDL සමාගම ඈවර කරනවාට විරෝධය පාමින් 2007 අංක.7 දරණ සමාගම් පනත ප්‍රකට ලෙසින් උල්ලංඝනය කළ HDL සමාගමේ රජයේ අධ්‍යක්ෂකවරුන් ලැයිස්තුගත පොදු සමාගමක අධ්‍යක්ෂකවරුන් වීමට සුදුසු සහ නිසි පුද්ගලයන් නොවෙති.

**(h)** 2007 අංක.7 දරණ සමාගම් පනතේ 277 වගන්තියේ නියමයන් අනුව, **සමාගමක ඈවර කිරීම ආරම්භවීම, ඈවර කිරීම සඳහා පෙත්සම ඉදිරිපත් කළ කාලයේ සිටම වන බවට සැළකේ.**

13. (a) මුදල් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබ, 2006.11.17 දින ඈවර කිරීම සඳහා පෙත්සම ඉදිරිපත් කිරීමෙන් පසුව, HDL සමාගමේ අධ්‍යක්ෂකවරුන් වී ඇති අය මෙසේ ය.

| | | |
|---|---|---|
| ටී.නඩේසන් | - | සභාපති (2010.05.12 සිට) |
| එන්.රජාබ්දීන් | - | සභාපති 2010.05.21 ඉල්ලා අස්විය. |
| වී.කනගසභාපති | | |
| කේ.වී.එන්.ජයවර්ධන | | |
| ටී.වික්‍රමසූරිය | | |
| එන්.වරුසවිතාරණ | | |
| කේ.වික්‍රමනායක | | |

**(b) 2007 අංක.7 දරණ සමාගම් පනතේ නියත විධිවිධානයන්, 191 සිට 195 දක්වා වගන්තීන් ද ඇතුළත්ව, විශේෂයෙන් 187, 188, 189, 190, 197, 374, 375 වගන්තීන්වල විධිවිධානයන්වලට අදාළව එම පනතේ 529 වගන්තියේ අධ්‍යක්ෂකවරුන්ගේ අර්ථ නිරූපණය නියමිතව දක්වා ඇති ප්‍රකාරව, සමාගමක අධ්‍යක්ෂවරුන් ක්‍රියා කරනු ලබන්නේ යම් පුද්ගලයන්ගේ නියමයන් හෝ උපදෙස් අනුව වේනම්, එවැනි උපදෙස් දෙන පුද්ගලයන් ද සමාගමක අධ්‍යක්ෂකවරුන් වනු ලබන බවට සැළකේ.**

**(c) රටෙහි ව්‍යවස්ථාපිත නීතිය ප්‍රකට ලෙසට උල්ලංඝනය කර තිබීම නියත ලෙසින්ම ත්‍රස්තජනකය.**

14. මුදල් ප්‍රකාශනයන් ප්‍රකාර, වැඩිදුරටත් සෝදා පාළුවුන HDL සමාගමේ ආනුෂංගික 2010.03.31 දිනට ශේෂ පත්‍රය පහත දැක්වෙන ලෙසට වන බවට ප්‍රකාශ කර ඇත.

| | | | | |
|---|---|---|---|---|
| | රු.මිලියන | | | රු.මිලියන |
| කොටස්හිමියන්ගේ හිමිකම (Equity) | | ජංගම නොවන වත්කම් | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 452 | දේපල, යන්ත්‍රෝපකරණ | | 6,127 |
| ප්‍රතිමාණ සංචිතය | 4,706 | කලින් ගෙවූ බදුකුලී | | 185 |
| ගෘහභාණ්ඩ සවිකිරීම් සහ | | | | 6,312 |
| උපකරණ සංචිතය (FF & E) | 371 | | | |
| එකතුවුන පාඩුව | (10,302) | | | |
| හිගය | (4,773) | | | |
| ජංගම නොවුන වගකීම් | | ජංගම වත්කම් | | |
| පොළී සහිත ණයමුදල් | 10,268 | බඩු ලේඛණ | | 49 |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැදීම් | 69 | ලැබිය යුතු | | 208 |
| | 10,337 | කෙටිකාලීන ආයෝජන | | |
| | | - භාණ්ඩාගාර බිල්පත් | 668 | |
| ජංගම වගකීම් | | - බැංකු තැන්පතු | 114 | 802 |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු | 371 | මුදල් සහ බැංකු | | 24 |
| පොළී සහිත ණය මුදල් (වසර 1) | 1,457 | | | 1083 |
| බැංකු අයිරාව | 3 | | | |
| | 1,831 | | | |
| මුළු වගකීම් | 12,168 | | | |
| වගකීම් හිගය අඩුකල පසු | 7,395 | මුළු වත්කම් | | 7,395 |

15. (a) 4 වන සහ 5 වන වගඋත්තරකරුවන්ට ගෙවීම් කිරීම් පිණිස, රු.12,098,634,769/77 කට ගණනය වන්නේ යයි ප්‍රකාශිත HDL සමාගමට අත්තිකාරම් කළ ණය මුදල් ආපසු ගෙවීමට අවශ්‍ය බව 2011.05.03 දිනැති ලිපිය මඟින් ශ්‍රී ලංකා රජය විසින් HDL සමාගමට නියම කර ඇත.

(b) 18 වසරක කාලසීමාවක් පුරා ණය මුදල් ශ්‍රී ලංකා රජය වෙත ආපසු ගෙවීමට යෝජනාවක් HDL විසින් 2011.05.06 දිනැති ලිපියෙන් ඉදිරිපත් කර ඇත.

(c) HDL සමාගමේ ගෙවීමේ යෝජනාව පිළිගැනීම ශ්‍රී ලංකා රජය විසින් 2011.05.10 දිනැති ලිපියෙන් ප්‍රතික්ෂේප කර සිටිමින්, රු.12,098,634,769/77 ක් සඳහා වන ගෙවිය යුතු ලෙසට ඉල්ලා ඇති මුදල් ප්‍රමාණය මාසික වාරික පදනමක් මත වසර 2 කක කාලසීමාවක් ඇතුළත ආපසු ගෙවීමට අවශ්‍ය බව HDL සමාගමට නියම කර ඇත.

(d) රජයේ අධ්‍යක්ෂකවරුන් **HDL** සමාගමේ පූර්ණ කළමනාකරණයේ සහ පාලනයේ යෙදී සිටියදී, ඉහත කී ලිපි හුවමාරුව නියත ලෙසින්ම බේද-විකට නාටකයකි.

*2011.05.03, 2011.05.06 සහ 2011.05.10 දිනැති ලිපිවල සත්‍ය පිටපත් පිළිවෙලින් "A10(a)", "A10(b)" සහ "A10(c)" යනුවෙන් ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙසට අයැද යා කොට ඇත.*

16. (a) ශ්‍රී ලංකා රජය විසින් HDL සමාගමට අත්තිකාරම් කළ ණයවල ප්‍රාග්ධන මුදල පහත දැක්වෙන පරිදි, **(A7 හී P13(a) සිට P13(h) බලන්න)** රු.3,949,888,916/- කට පමණක් ගණනය වී ඇත.

| ණය මුදලේ දිනය | මුදල (රු.) | පොළී අනුපාතය |
|---|---|---|
| 97.07.01 | 288,567,631 | 12.50% |
| 99.07.07 | 469,742,070 | 12.50% |
| 00.07.03 | 464,427,826 | 12.50% |
| 01.07.03 | 360,618,876 | 18.56% |
| 02.07.03 | 446,803,874 | 12.50% |
| 03.07.01 | 340,024,378 | 9.40% |
| 04.07.01 | 395,658,959 | 8.59% |
| 05.06.30 | 225,639,338 | 10.28% |
| 06.06.30 | 157,555,617 | 11.61% |
| 07.06.30 | 344,772,738 | 18.77% |
| 08.06.30 | 456,077,609 | 20.59% |
| එකතුව | 3,949,888,916 | |

(b) පොළී හෝ ප්‍රාග්ධන මුදල වෙනුවෙන් HDL සමාගම විසින් ශ්‍රී ලංකා රජයට කිසිදු ආපසු ගෙවීමක් කර නොමැත.

(c) 2010.03.31 දිනට HDL සමාගමේ ඉහත කී ශේෂ පත්‍රයට ඉහත සඳහන් අනුපාතයට පොළී, වාර්ෂිකව සංයෝජනය කරමින් ඇතුළත් කර ඇත.

(d) පොළී මුදල් මුල් මුදල ඉක්මවා නොයායුතු බව සිවිල් නීති ආඥාපනතේ 5 වන වගන්තියේ විධානය කොට ඇත.

(e) එමනිසා 2010.03.31 දින HDL ගිණුම්වල ප්‍රකාශිත පොළී සාවද්‍ය සහ නීති විරෝධී ලෙස අධික දැක්වීමකි.

(f) වසර 2 ක් ඇතුළත ගෙවිය යුතු ලෙසට ඉල්ලා ඇති පරිදි (A10(c) බලන්න) ශ්‍රී ලංකා රජයට එහි නිත්‍යානුකූල ලැබීම් ගෙවීම සඳහා, HDL සමාගමට සහ/හෝ එහි කොටස් හිමියන්ගෙන් කුමන අයකුට හෝ වැඩි අයවළුන්ට ආයෝජන උපයාදීමට හිමිකම් ඇත.

17. (a) 2007 අංක.7 දරණ සමාගම් පනතේ 277 වගන්තිය සමඟ කියැවෙන 364 වගන්තියේ නියමිතයන් අනුව, 2006.11.17 දින HDL සමාගම ඈවර කිරීමට පෙත්සම ඉදිරිපත් කර සිටීමෙන් අනතුරුව, කිසිදු පොළියක් HDL සමාගම විසින් ගෙවිය හෝ HDL සමාගමෙන් අයකර ගත හෝ නොහැක.

(b) එමනිසා, 2006.11.17 දිනෙන් පසුව ශ්‍රී ලංකා රජය විසින් අයකර ගතහැකි හෝ ශ්‍රී ලංකා රජයට ගෙවිය යුතු කිසිදු පොළියක් නොමැත.

(c) ඒ හා සමාන ලෙසට, 2006.11.17 දින ඈවර කිරීම සඳහා පෙත්සම ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, 4 සහ 5 වන වගඋත්තරකරුවන්ට 2011 මාර්තු මස දී, 14 සහ 15 වාරිකයන් මත පොළී ගෙවීම ද සාවද්‍ය සහ නීතිවිරෝධී ය.

*4 සහ 5 වගඋත්තරකරුවන් වෙතින් 2011.03.23 දිනැති ලිපියේ සත්‍ය පිටපතක් "A11" යනුවෙන් ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙසට අයැද යා කොට ඇත. A10(a) 2011.05.03 දිනැති ලිපි කෙරෙහි අවධානය යොමු කිරීම සහිතවය.*

18. නීතිය අතික්‍රමණය කොට, ශ්‍රී ලංකා රජයට පූර්වෝක්ත පාඩු සිදුකළ එම පුද්ගලයන්ට ඒ සඳහා උත්තරදීම සහ වගකීම දැරීම පැවරිය යුතුය.

19. (a) පූර්වෝක්ත කරුණු කාරණා අනාවරණය කරනු ලබන්නේ, මුදල් අමාත්‍යවරයා විසින් නම් කොට පත්කරනු ලැබ ඇති බහුතර අධ්‍යක්ෂකවරුන් විසින් කළමණාකරණය සහ පාලනය කළ HDL සමාගම, අපරික්ෂාකාරී ලෙස නොමනා අන්දමින් පරිපාලනය කර ඇති බවයි.

(b) **HDL සමාගම පාඩු දරමින් දුබල වී අන්ත මූල්‍ය ප්‍රපාතයකට ඇදවැටී පෙළෙත් දී ඔවුන් විසින් ඔවුන්හට පඩිනඩි, දීමනා ගෙවා ගනිමින් අනිකුත් අවශ්‍යතාවයන් ද බුක්ති විඳිමින් සිට ඇත.**

(c) ලැබී ඇති විශ්වාසදායක තොරතුරු අනුව, HDL සමාගමේ උග්‍ර මූල්‍ය අවදානම එතකුදුවත්, HDL සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී, BMWSUV හෝ ඊට

සමාන වර්ගයේ රුපියල් මිලියන 25 සිට 30 දක්වා වන ආසන්න මිළකට වාහනයක් HDL සමාගමේ සභාපති ටී.නඩේසන් සඳහා මිළයට ගැනිමට තීරණය කර ඇත. එනම්,

**"3. සභාපති සඳහා වාහනයක් මිළදී ගැනිම**
මේ සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල ලේඛණය සභාගත කරන ලදී.
BMWSUV හෝ ඊට සමාන වර්ගයේ වාහනයක් HDL සමාගමේ සභාපති සඳහා මිළයට ගැනිමට තීරණය කර ඇති අතර වර්තමාන සභාපති විසින් පාවිච්චි කළ හුන්ඩායි වර්ගයේ වාහනය විකිණිම සඳහා ද අනුමැතිය ලබාගෙන ඇත.''

***පරීක්ෂා කර බැලීමකට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන්වල සත්‍ය පිටපතක් "A12" යනුවෙන් ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙසට අයැද යා කොට ඇත.***

20. යෝජිත වැඩ පිළිවෙළ සහ සමථයකට එළඹීම පහත දැක්වේ.

(a) ශ්‍රී ලංකා රජයට ණය මුදල්වල මුල් මුදල සහ ඒ මත නීත්‍යානුකූල පොළිය ආපසු ගෙවීමට HDL සමාගමේ කොටස් විභාජනයක් මත අයෝජකයකුගෙන් අරමුදල් උපයාදීමට.

(b) දැන් නිශ්ඵලතාවයට පත්ව ඇති සහ ගෙවා නොමැති ලෙසට පවතින, නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් අතුරු බද්දකට ගැනීම සඳහා විභාජනය කළ HDL සමාගමේ කොටස් 25,089,750 අහෝසි කොට අවලංගු කිරිම.

(c) මුල් ගෙවීම අයෝජකයකු මඟින් ගෙවා ඉතිරි එකඟවන, ලබන වාරික මඟින් ගෙවීම සඳහා HDL සමාගම විසින් එම ඉඩම් කෙලින්ම ශ්‍රී ලංකා රජයෙන් බද්දට ලබා ගැනිම.

(d) HDL සමාගමේ කොටස් විභාජනයක් මඟින් හෝ අන් ආකාරයකින්, හෝටල් කාමර සහිත 3 වන කුළුන ඉදිකිරිමට සහ අති නවීන සංවර්ධන සංකීර්ණයක් සහිතව, අක්කර 2 1/2 ක ක්‍රීඩා විනෝදාංශ ප්‍රදේශය ප්‍රති සංවර්ධනය කිරිමට ද අරමුදල් උපයාදීම.

21. (a) HDL සමාගමේ තත්වයෙහිලා, HDL සමාගමේ ප්‍රති-වැඩපිළිවෙළක් සහ සමථයකට එළඹීම සඳහා 2007 අංක.7 දරණ සමාගම් පනතේ X කොටස යටතේ මෙම ඉල්ලීම කර සිටිමට, පෙත්සම්කරුට හොඳාකාර, ප්‍රමාණවත් සහ වලංගු හේතූන් පැන නැගී ඇත.

(b) HDL සමාගමේ 2010.03.31 දිනෙන් අවසන් වර්ෂයට මූල්‍යමය තත්වයන් මුදා නොහරින ලදුව, පෙත්සම්කරු වෙත එය ලැබුනේ 2011.11.02 වන දින පමණි.

(c) එම හේතු තත්වයන් මත, ගරු අධිකරණයට සහයක් දක්වනු පිණිස, අවශ්‍ය යයි හැඟී යන යම් වැඩිදුර කරුණු සහ/හෝ ලේඛණ ඉදිරිපත් කර සිටීමේ අයිතිය පෙත්සම්කරු ගෞරව පූර්වකව රඳවා ගනු ලැබේ.

*එබැවින් පෙත්සම්කරු ගරු අධිකරණයෙන් අයැද සිටිනු ලබන්නේ කාරුණිකව,*

(a) මෙම ඉල්ලීම ඉදිරියට ගෙන යාමට පෙත්සම්කරුට අවසරය ප්‍රදාන කරන ලෙසත්,

(b) මෙම ඉල්ලීම පිළිබඳව දැන්වීම වගඋත්තරකරුවන් වෙත නිකුත් කරන ලෙසත්,

(c) යෝජිත වැඩ පිළිවෙල සහ සමථයට එළඹීම පිළිබඳව ගරු අධිකරණය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන තැනැත්තකු විසින් පිළියෙළ කරනු ලබන වාර්තාවක් ඉදිරිපත් කිරීම අවශ්‍ය කරමින් නියෝගයක් කරන ලෙසත්,

(d) ශ්‍රී ලංකා රජයට ගෙවිය යුතු නීත්‍යානුකූල ණය හිමිකම් ආපසු ගෙවීම සඳහා ආයෝජකයකුගෙන් අරමුදල් උපයා HDL සමාගමේ කොටස් හි ආයෝජනය කිරීමට HDL සමාගමට සහ/හෝ එහි කොටස්හිමියන්ගෙන් එක අයකුට හෝ ඊට වැඩි දෙනෙකුට හිමිකම් ඇති බවට ප්‍රකාශ කරමින් නියෝගයක් කරන ලෙසත්,

(e) ව්‍යාර්ථවුන ඉඩම් බද්ද සඳහා විභාජනය කළ HDL සමාගමේ කොටස් 25,089,750 අවලංගු කරමින් නියෝගයක් කරන ලෙසත්,

(f) ශ්‍රී ලංකා රජය සමඟ එළඹුන “A3(a)”, “A3(b)”, “A3(c)” සහ ”A3(d)” සමථය ගිවිසුම්වල නියමයන් ප්‍රකාර ශ්‍රී ලංකා රජයෙන් කෙලින් ඉඩම් බදු ගැනීමට HDL සමාගමට හිමිකමක් ඇති බව ප්‍රකාශ කරමින් නියෝගයක් කරන ලෙසත්,

(g) ඉහත කී වැඩ පිළිවෙල සහ සමථයට එළඹීම HDL සමාගම සහ අනිකුත් අදාළ පුද්ගලයන් මත බැඳීමකින් යුතුව වනු ලබන බවට ප්‍රකාශ කරමින් නියෝගයක් කරන ලෙසත්,

(h) HDL සමාගමට අදාළ සියළුම නීති කෘතීන් නවතාලිය යුතු බවට නියම කරමින් නියෝග කරන ලෙසත්,

(i) ගරු අධිකරණයට සුදුස යැයි හැඟෙන වෙනත් එවැනි සහ වැඩිදුර සහනයන් ප්‍රදානය කරමින් නියෝගයක් කරන ලෙසත් ය.

V. W. Kularatne Associates

පෙත්සම්කරුගේ නීතිඥවරුන්.

V. W. KULARATNE ASSOCIATES
Attorneys-at-Law & Notaries Public
18/39, Muhandiram Dabare Mawatha
Colombo 5, Sri Lanka.